கோவிட் - 19 பரவல் தடுப்புக்கான தேசிய செயல்பாட்டு மையம்
NATIONAL OPERATIONS CENTRE FOR PREVENTION OF COVID - 19
සිනෝ ලංකා ටවර්, අංක **1090,** ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය

නිවේදන අංක **25 :2021**
නිකුත් කරන ලද වේලාව **: 0600**

අධ්‍යක්ෂ ජෙනරාල්
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
අංක **163,**
කිරුළපන මාවත,
කොළඹ **05** **2021** ජනවාරි මස **25** වන දින

<u>මාධ්‍ය ප්‍රචාර ලබා ගැනීම</u>

කොවිඩ්-**19** පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය වෙතින් අද **(25)** දින ඉදිරිපත් කරනු ලබන තොරතුරු පහත සඳහන් වන අතර, එම තොරතුරු මාධ්‍ය නිවේදනයක් ලෙස මහජනතාව වෙත නිකුත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

අද **(25)** දින උදෑසන වනවිට ශ්‍රී ලංකාවෙන් කොවිඩ් **- 19** ආසාදිත පුද්ගලයින් **843** දෙනෙකු හඳුනාගෙන ඇත. එම පුද්ගලයින් අතරින් පුද්ගලයින් **02** දෙනෙකු විදේශගතව සිට මෙරටට පැමිණි දේශීය පුද්ගලයින් ලෙස වාර්ථා වේ. ඉතිරි පුද්ගලයින් **841** දෙනා දේශීයව හඳුනාගත් පුද්ගලයින් ලෙස වාර්ථා වේ. හඳුනාගත් ආසාදිතයින් අතරින් වැඩිම ආසාදිතයින් පිරිසක් කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්ථා වන අතර, ඒ ආසාදිතයින් **480** ක් ලෙසය. ඊට අමතරව, ගම්පහ දිස්ත්‍රික්කයෙන් ආසාදිතයින් **86** ක් සහ කළුතර දිස්ත්‍රික්කයෙන් ආසාදිතයින් **72** ක් ලෙස වාර්ථා වේ. අනෙක් ආසාදිතයින් **203** දෙනා දිවයිනේ සෙසු දිස්ත්‍රික්ක වලින් වාර්තා වේ.

අද **(25)** දින උදෑසන වනවිට, කොළඹ මත්ස්‍ය වෙළඳපලට සම්බන්ධ පොකුරෙන් වාර්තා වූ කොවිඩ් **- 19** වෛරසය ආසාදිත සම්පූර්ණ පුද්ගලයින් සංඛ්‍යාව **54,529** වේ. ඉන් පුද්ගලයින් **44,527** දෙනෙකු මේ වනවිට පූර්ණ සුවය ලබා රෝහල්වලින් බැහැරව ගොස් ඇත.

කොළඹ මත්ස්‍ය වෙළඳපලේ පොකුර **- 51,470**

අද **(25)** දින උදෑසන වනවිට, ශ්‍රී ලංකාව තුළ කොවිඩ්-**19** වෛරසය ආසාදනය වූ සම්පූර්ණ ආසාදිතයින් සංඛ්‍යාව **58,429** ක් වන අතර ඉන් පුද්ගලයින් **49,683** ක් පූර්ණ සුවය ලබා රෝහල්වලින් බැහැරව ගොස් ඇත. අද **(25)** දින උදෑසන වනවිට, රෝහල්ගතව සහ අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථාන තුළ ආසාදිතයින් **8,463** දෙනෙකු තවදුරටත් ප්‍රතිකාර ලබයි.

අද **(25)** දින උදෑසන **0600** වනවිට (පසුගිය පැය **24** තුළ) රෝහල්ගතව සහ අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථාන තුළින් පුද්ගලයින් **423** ක් පූර්ණ සුවය ලබා පිටව ගොස් ඇත.

අද **(25)** දින උදෑසන වනවිට (පසුගිය පැය **24** තුළ) ශ්‍රී ලංකාව තුළින් කොවිඩ්-**19** වෛරසය ආසාදනය වී පුද්ගලයින් **03** දෙදෙනෙකු මියගොස් ඇති අතර ඔවුන් මරදාන, කොළඹ **14** සහ පූජාපිටිය යන ප්‍රදේශයන්හී පදිංචි පුද්ගලයින් ලෙස වාර්තා වේ. ඒ අනුව, අද **(25)** දින උදෑසන වනවිට ශ්‍රී ලංකාව තුළින් කොවිඩ් **- 19** ආසාදිත සම්පූර්ණ මරණ සංඛ්‍යාව **283** ක් දක්වා ඉහළ ගොස් ඇත.

අද **(25)** දිනයේදී ත්‍රිවිධ හමුදාව මගින් පාලනය කරනු ලබන නිරෝධායන මධ්‍යස්ථාන **94** ක් තුළ පුද්ගලයින් **7,812** දෙනෙකු නිරෝධායනය වෙමින් සිටියි.

ඊයේ **(24)** දිනය තුල **PCR** පරීක්ෂණ **17,523** ක් සිදුකර ඇත.